# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2026 අංක 24 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 ඔක්තෝබර් මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 ඔක්තෝබර් මස 09 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2026 අංක 24 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2026 ඔක්තෝබර් මස 06 වන දින]

එල්.ඩී.-ඕ. 57/2025

### 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක 24 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1992 අංක 46 දරන පනතට කරනු ලබන පොදු සංශෝධනය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතේ "අධ්‍යක්ෂවරයා" යන වචනය යෙදෙන සෑම ස්ථානයක ම ඒ වචනය වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන්" යන වචන වෙනුවට "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයන්, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකුගේ හෝ සහකාර අධ්‍යක්ෂවරයකුගේ" යන වචන වෙනුවට "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ, අධ්‍යක්ෂවරයකුගේ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකුගේ හෝ සහකාර අධ්‍යක්ෂවරයකුගේ" යන වචන ආදේශ කිරීමෙන්.

PL 15894 - 768 (2026/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන වෙනුවට "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන වෙනුවට, "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "අපනයන කෘෂිකර්ම භෝගය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

""අපනයන කෘෂිකර්ම භෝගය" යන්නෙන්, ආහාර භෝග බාණ්ඩයට අයත් වන වී, එළවළු, පලතුරු, අල භෝග සහ අතිරේක ආහාර භෝග හැර දේශීය පරිභෝජනයට අමතරව අපනයනය කිරීමේ හැකියාවක් ඇති භෝගයක් වශයෙන් හඳුනාගත් සහ මේ පනතේ 2 වන වගන්තිය යටතේ "නිවේදිත කෘෂිකාර්මික භෝගයක්" ලෙස විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් භෝගයක් අදහස් වන අතර වැවිලි භෝගයක් ලෙස හඳුනාගත් යම් භෝගයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.